05

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා ගෞරව උපාධි වැඩසටහන-පස්වන මට්ටම - 2021/2022

අවසාන පරීක්ෂණය 2022

STU5329 - විෂයමාලා න්‍යාය හා පරිචය

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2022.12.10 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. විෂයමාලාව යන පදයෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

02. විෂයමාලා සංවර්ධන ක්‍රියාවලියක අඩංගු විය යුතු මූලිකාංග හතරක් (04) ක් නම් කරන්න.

03. සැඟවුණු විෂයමාලාව යනු කුමක්දැයි උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

04. පාසල් විෂයමාලාවකින් ඉටුකර ගැනීමට අපේක්ෂිත මූලික කාර්යයන් හතරක් (04) සඳහන් කරන්න.

05. දර්ශනය හා පාසල් විෂයමාලාව අතර ඇති සම්බන්ධය විස්තර කරන්න.

06. වැඩ ලෝකයට අවශ්‍ය නිපුණතා සංවර්ධනය සඳහා ද්විතීය පාසල් විෂයමාලාවේ ඇති කළයුතු වෙනස්කම් හතරක් (04) දක්වන්න.

07. වර්ෂ 1972 විෂයමාලා ප්‍රතිසංස්කරණ කෙරෙහි බලපෑ පසුබිම කෙටියෙන් විස්තර කරන්න.

08. විෂයමාලා කළමනාකරණයේ අවස්තා තුනක් (03) සඳහන් කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) ටයිලර් ගේ විෂයමාලා ආකෘතිය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) එහි දුබලතා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iii) එම දුබලතා වීලර්ගේ ආකෘතියෙන් මගහරවා ගතහැකි දැයි පරීක්ෂා කරන්න.(ලකුණු 10)

10. (i) ඉන්දියාවේ අධ්‍යාපන පර්යේෂණ හා පුහුණු කිරීම් පිළිබඳ ජාතික කවුන්සිලය මගින් ප්‍රසිද්ධියට පත්කොට ඇති විෂයමාලා සංවර්ධන මූලධර්ම මොනවා ද? (ලකුණු 05)

(ii) එම මූලධර්ම කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(iii) විෂයමාලා සංවර්ධනයේ දී එම මූලධර්ම සැලකිල්ලට ගැනීමේ වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 10)

11. (i) විෂයමාලා සංවර්ධන ප්‍රවේශ හතර (04) නම් කරන්න. (ලකුණු 04)

(ii) ඉන් එක් ප්‍රවේශයක් තෝරාගෙන එහි ස්වභාවය කැපී පෙනෙන ලක්ෂණ සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii) ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාව සංවිධානයේ දී භාවිතයට ගෙන ඇති විෂයමාලා සංවිධාන ප්‍රවේශ පරීක්ෂා කරන්න. (ලකුණු 08)

12. (i) නාට්‍ය හා රංගකලා විෂය අරමුණු මොනවාදැයි කෙටියෙන් හඳුන්වා දෙන්න. (ලකුණු 04)

(ii) නාට්‍ය හා රංගකලා විෂයමාලාව තුළ සංවිධානය කර ඇති ප්‍රායෝගික ඉගෙනුම් අවස්ථා මොනවා ද? (ලකුණු 08)

(iii) වර්තමාන අවශ්‍යතා අනුව නාට්‍ය හා රංගකලා විෂයමාලාවට ඇති කළයුතු වෙනස්කම් යෝජනා කරන්න. (ලකුණු 08)

13. (i) 'විෂය සන්ධාරය' යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) නාට්‍ය හා රංගකලා ගුරුවරයෙකුහට තම විෂය සන්ධාරය ඉගැන්වීමට තොරතුරු ලබාගැනීමට තෝරා ගත හැකි මූලාශ්‍ර මොනවා ද? (ලකුණු 08)

(iii) නාට්‍ය හා රංගකලා ගුරුවරයෙකුහට තම විෂය සන්ධාරය ඉගැන්වීමේ දී තාක්ෂණය උපයෝගී කර ගැනීමේ වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 08)

14. (i) විෂයමාලාව ඇගයීමට ලක් කළහැකි ප්‍රධාන ඇගයීම් ක්‍රම දෙක (02) නම් කරන්න. (ලකුණු 04)

(ii) නාට්‍ය හා රංගකලා ගුරුවරයෙකුහට සංවිධානය කරගත හැකි ඇගයීම් ක්‍රම මොනවා ද? (ලකුණු 08)

(iii) ඉහත සඳහන් කළ එක ඇගයීම් ක්‍රමයක වාසි සහ අවාසි සාකච්ඡා කරන්න. (ලකුණු 08)

- හිමිකම් ඇවිරිණි. -